# පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

# තනතුරු පුරප්පාඩු

isharaiz.com

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙහි පවතින පහත සඳහන් තනතුරු පිරවීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. රියදුරු තනතුර (PL 3) – (තනතුරු 03) - ප්‍රධාන කාර්යාලය

**රැකියා විස්තරය:** මාර්ග නීති රීති වලට අනුගත වෙමින් සහ කාර්ය භාර නිලධාරියාගේ උපදෙස් අනුව මෝටර් රථ ධාවනය, ධාවන සටහන්, සේවා වාර්තා ආදිය නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම, වාහනයේ දෛනික නඩත්තුව, වාහනයේ තත්ත්වය පිළිබඳව කාර්යභාර නිලධාරියා දැනුවත් කිරීම, වාහනය සේවාකිරීම සහ අලුත්වැඩියා අවශ්‍යතා ඉටු කිරීම, කිසියම් සිදුවීමක් හෝ අනතුරක් සිදුවුවහොත් කාර්යභාර නිලධාරියා දැනුවත් කිරීම, කාර්යභාර නිලධාරියා /අංශ ප්‍රධානියා විසින් පවරන ලද වෙනත් රාජකාරිඉටු කිරීම.

**<u>සුදුසුකම්:</u>**

**අධ්‍යාපන සුදුසුකම්:** සිංහල හෝ දෙමළ ඇතුළු විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම.

සහ

**වෘත්තීය සුදුසුකම්:** වලංගු බර වාහන පැදවීමේ බලපත්‍රයක් තිබීම සහ පිළිගත් ආයතනයකින් බර වාහන පැදවීමේ අවම වශයෙන් අවුරුදු තුනක පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

ප්‍රාථමික මට්ටමේ සේවකයින් - අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිට අවම වශයෙන් විෂයයන් 02ක් සමත් වී බර වාහන පැදවීම සඳහා වලංගු බලපත්‍රයක් ලබාගෙන වසර 3ක රිය පැදවීමේ පළපුරුද්දක් ඇති නුපුහුණු තැනැත්තන්

**වැටුප් පරිමාණය:** PL 3 : 2025 රු.(43,280 - 10 x 490 – 10 x 540 – 10 x 590 – 12 x 630 – 67,040) (2027.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

**වැටුප:** රු. 40,834/- (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (DMS) චක්‍රලේඛ අංක 01/2025 ප්‍රකාරව 2026.01.01 දිනට මූලික වැටුප)

**වයස:** වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතු ය.

**<u>පොදු කොන්දේසි:</u>**

***පත්වීමේ ස්වභාවය :***
ස්ථිර තනතුරක් වන අතර අදාළ රාජ්‍ය චක්‍රලේඛයන්හි විධිවිධානයන්ට අනුව සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල යටතේ ප්‍රතිලාභ ලැබීමට හිමිකම් ලබයි.

***බඳවාගැනීමේදී වැටුප :*** බාහිර වශයෙන් බඳවාගන්නා ලද පුද්ගලයින් වැටුප් පරිමාණය ආරම්භක පියවරෙහි තබනු ලැබේ. අභ්‍යන්තරව බඳවාගනු ලබන පුද්ගලයින්ගේ වැටුප ආයතන සංග්‍රහයෙහි VII වන පරිච්ඡේදයේ විධිවිධාන අනුව තීරණය කරනු ලැබේ.

isharaiz.com

***වෙනත්:***

ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
තනතුරෙහි රාජකාරි මනා ලෙස ඉටු කිරීමටත් සහ දිවයිනෙහි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට
මනා කායික සහ මානසික සෞඛ්‍යයකින් හෙබි අයෙකු විය යුතුය.
විශිෂ්ඨ සදාචාරාත්මක චරිතයකින් යුක්ත විය යුතු ය.

යෝග්‍යතා පූර්ණ අයදුම්කරුවන් මෙම දැන්වීම පළ වූ දින 2026.10.06 සිට 2026.10.19 දින දක්වා ලියාපදිංචි තැපෑලෙන් පහත දැක්වෙන ලිපිනයට අයදුම්පත් යොමු කළ යුතුය. සුදුසුකම් සනාථ කරන අදාළ සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතු ය. රාජ්‍ය අංශයේ සේවකයින් ස්වකීය අයදුම්පත්‍ර අදාළ අංශ ප්‍රධානීන් මඟින් යොමු කළ යුතුය. ඉහත අවශ්‍යතාවලට අනුකූල නොවන, අසම්පූර්ණ අයදුම්පත්‍ර සහ අයදුම්පත්‍ර භාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ. ඉල්ලුම් කරනු ලබන තනතුර ලිපි කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි සඳහන් කළ යුතුය. අයදුම්පත් පහත ලිපිනයට එවිය යුතුය ;

**අධ්‍යක්ෂ ජනරාල්,**
**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය,**
**පළමු මහළ සහ දෙවන මහළ, සතොස මහ ලේකම් ගොඩනැගිල්ල,**
**අංක 27 , වොක්ෂෝල් වීදිය,**
**කොළඹ 02**

www.caa.gov.lk
Tel. 0117755455/456

2026.10.06